**සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2020**

**------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතු භාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භෞතිකව මණ්ඩලය සතුව නොතිබුණු රු.8,095,000 ක් වටිනා කැබ් රථයක පිරිවැය ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මණ්ඩලය සතුව නොතිබුනද රු.8,095,000 ක් වටිනා කැබ් රථය මිළදීගෙන මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇති අතර ඒ සඳහා මුදල් "United Motors" ආයතනයට ගෙවා ඇති බැවින් එය ආයතනයේ වත්කමක් ලෙස සලකා එහි පිරිවැය ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇත. එම රථයට ගෙවන ලද පිරිවැය රථය රැගෙන ගිය පාර්ශවයෙන් අයකර ගැනීමට නීතිමය කටයුතු වර්තමානය වන විට කරගෙන යනු ලබයි. | භෞතිකව වත්කම් නොමැති නිසා රැගෙන ගිය පාර්ශවයගෙන් රු.8,095,000 ක මුදල අයකිරීමට කටයුතු කිරීම. |
| (ආ) | මණ්ඩලයට අයිති නොමැති ඉඩමක ඉදිකිරීමේ කටයුත්තක් වෙනුවෙන් දරන ලද රු.492,392 ක මුදලක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණද එම මුදල තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු මුදලක් බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් දේපල පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩිපුර දැක්වුණු අතර ජංගම වත්කම්ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ඉඩම වෙනුවෙන් දරන ලද පිරිවැය වන රු.492,392 ක් වන මුදල අයකර ගැනීමට උත්සාහ කලද තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්වරයා විසින් දැනුම්දී ඇත්තේ රජය සතු ඉඩමක් සංවර්ධනය කිරීමට දරා ඇති පිරිවැය නැවත අයකර දීමේ හැකියාවක් නොමැති බවයි. ඒ අනුව එම මුදල කපාහැරීම සඳහා 2021 වර්ෂයේ මාර්තු මස 02 වැනි දින පැවති 248 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිවිය. ඒ අනුව 2021 වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේදී රු.492,392 ක් මුදල් කපාහැරීමට කටයුතු කරනු ඇත. | කපා හැරීමට විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සටහන් අංක 11 අනුව මෝටර් රථ ක්ෂය වෙන්කිරීම් ගිණුමේ ආරම්භක ශේෂය රු.46,792,272 ක් වුවද විගණනය සඳහා ඉදිරිපත් කල විස්තරාත්මක උපලේඛනය අනුව එය රු.48,480,633 ක් වීම හේතුවෙන් රු.1,688,361 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | 2020 ජනවාරි 01 දිනට පැවති මෙම වෙනස සම්බන්ධයෙන් එකඟ වන අතර 2020 වර්ෂයේ සිදු කරන ලද ප්‍රත්‍යාගණනයේදී මෙම වරද නිවැරදි කර ඇත. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දින ශේෂය නිවැරදි බව තහවුරු කල හැකිය. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආනයනය කරන ලද වාහනයකට අදාළව පෞද්ගලික නියෝජිත ආයතනයකට ගෙවිය යුතුව පැවති රු.1,266,631 ක මුදලක් සම්බන්ධයෙන් උසාවියේ පැවති නඩු කටයුත්තක් සමාලෝචිත වර්ෂයේ අවසන් කර තිබුණද ඒ සඳහා වූ වගකීම ජංගම වගකීම්වලින් ඉවත් නොකර තවදුරටත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | PB – 6024 දරණ කැබ් රථයට අදාලව යුනයිටඩ් මෝටර්ස් ආයතනයට ගෙවිය යුතුව පැවති රු.8,095,000 ක මුදල වෙනුවෙන් පොලිය වශයෙන් වසර 10 කට සියයට 10 බැගින් රු.8,095,000 ක අමතර මුදලක් 2018 වර්ෂය අවසානයේදී ඇස්තමේන්තු කරන ලදි. කෙසේ නමුත් මේ සඳහා පොලී වශයෙන් රු.6,828,369 ක මුදලක් පමණක් ගෙවීමට සිදුව ඇති බව පාලන අංශය විසින් 2021 මාර්තු 10 වන දින ගිණුම් අංශය වෙත ලිපියක් මගින් දැනුම් දී ඇති අතර 2021 මාර්තු මසදී මෙම නෛතික ගාස්තු අධි වෙන් කිරීම සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කර නිවැරදිව ගිණුම්ගත කර ඇත. | 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කිරීම. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව අයවිය යුතු ණය ශේෂය රු.1,246,717 ක් වුවද විගණනය සඳහා ලබාදෙන ලද උපලේඛනයේ එම ශේෂය රු.1,096,717 ක් විය. ඒ අනුව රු.150,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | එකග වේ. Employee Contribution ලෙස සටහන් විය යුතු රු.150,000 ක මුදල Staff Loan Recovery Covid 19 ලෙස සටහන් වීම ප්‍රවර්තන වර්ෂයේ ගිණුම තුල නිවැරදි කර ඇති අතර උප ලේඛන අංක 1ට අදාලව අවසන් ශේෂයෙහි කිසිදු වෙනසක් සිදු වී නොමැත. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කිරීම. |
| (ඊ) | **2020** දෙසැම්බර් **31** දිනට බැංකු ගිණුම් **03** ක පැවති රු.**2,535,678** ක් වටිනා හඳුනානොගත් චෙක්පත් හා තැන්පතු හඳුනාගෙන ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි | බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් සහ අලෙවි නියෝජිතයින් විසින් මණ්ඩලය වෙත ටිකට්පත් අලෙවිය වෙනුවෙන් සහ අනෙකුත් විශේෂ ගෙවීම් වෙනුවෙන් සිදු කරන ලද මුදල් තැන්පතු නිසි හදුනා ගැනීම් රහිතව සිදු කිරීම හේතුකොට ගෙන මෙම ගැටලුව පැන නැගී ඇත. එයින් මාස 6ක් ඉක්මවූ හදුනාගත නොහැකි තැන්පතු මණ්ඩලයේ අනෙකුත් ආදායම් ලෙස ගිණුම් ගත කිරීමට මේ වන විටත් කටයුතු යොදා ඇත. | ගිණුම් 3 ක පවතින හදුනා නොගත් තැන්පතු නිවැරදිව හදුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කිරීම. |
| (උ) | 2020 ජනවාරි 01 දිනට ගෙවිය යුතු රඳවාගැනීමේ බදු ගිණුමේ ශේෂය රු.36,259,336 ක් වුවද 2019 දෙසැම්බර් මසට අදාල වෙන්කිරීම් රු.35,900,655 විය. ආරම්භක ශේෂය තුල පැවති එම රු.358,681 ක් වූ වෙනස සඳහා හේතු පැහැදිලි නොකල අතර සමාලෝචිත වර්ෂයේ අවසානයට ද එම වෙනස එලෙසම පැවතුණි. | එකහ වේ. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කිරීම. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) ත්‍යාග අයිතම් තොගය | 12,132,050 | 10,587,138 | 1,544,912 | එකඟ වේ. ගිණුම් අංශයේ හා ගබඩාවේ ඇති ත්‍යාග හා ප්‍රවර්ධන තොග ලෙජරයේ අයිතමයන් ප්‍රමාණාත්මකව නිවැරදි වන අතර ඒවායේ වටිනාකම් වල විචලතාවයන් පවතී. මූල්‍ය ප්‍රකාශනයන්ගේ තොග අයිතම් වල වටිනාකම් ගණනය කරනු ලබන්නේ FIFO ගිණුම් ප්‍රතිපත්තියට අනුකූලව වේ. | නිරීක්ෂණ සඳහා එකඟවී ඇති නිසා නිවැරදි කිරීමට කටයුතු කිරීම. |
| (ආ)ලොතරැයිපත් මුද්‍රණ වියදම | 013,451,308 | 448,978,201 | 2,329,812 | ප්‍රසම්පාදන අංශය විසින් විගණනයේ ඉල්ලීම මත 2020 වර්ෂයේ මුද්‍රිත ක්ෂණික ලොතරැයි ටිකට්පත් ප්‍රමාණන් පිළිබඳ තොරතුරු ලබාදී ඇත . කාශනය තුල ප්‍රළහෙත් මූල්‍ය 2020 වර්ෂයේ අලෙවි කර තිබූ මුළු ක්ෂණික ලොතරැයි ටිකට්පත් පිරිවැයට ඇතුලත්ව පවතී ඒ අනුව .2020 වර්ෂයේ ටිකට්පත් පිරිවැය තුල පෙර වර්ෂයේ මුද්‍රිත ටිකට්පත් තොග අලෙවි කර ඇති බැවින් එකී මුද්‍රිත පිරිවැය ප්‍රසම්පාදන අංශය විසින් ලබාදී ඇති 2020 වර්ෂයේ ටිකට්පත් මුද්‍රණ පිරිවැයට වඩා ඉහල අගයක් ගෙන ඇත.<br>ප්‍රසම්පාදන අංශය මගින් ලබාදී ඇති වාර්ථාවේ සසිරි ලොතරැයි ටිකට්පත් වල මුද්‍රණ පිරිවැය රු . | 2021 වර්ෂයේ වෙනස නිවැරදි කිරීමට කටයුතු කිරීම. |

00.46 ක් ලෙස සඳහන්ව ඇති අතර එය රු .00.49 ලෙස නිවැරදි විය යුතු අතර එම වාර්ථාවේ Sweep App මගින් අලෙවි කරණු ලබන ටිකට්පත් වලට අදාලව මුද්‍රණය කරනු ලබන ටිකට්පත්වල පිරිවැය ඇතුලත්ව නොමැත.
මෙම කරුණු මත විගණනය විසින් පෙන්වා දී ඇති පිරිවැය වෙනසක් සිදුව ඇත.
එමනිසා මූල්‍ය අංශයෙන් ලබාදී ඇති වාර්ථාව නිවැරදි වන අතර ඉදිරියේදී මූල්‍ය විගණනය සඳහා උපචිත පදනම මත ගිණුම් අංශය මගින් ලබාදෙන වාර්ථා පදනම් කර ගන්නා ලෙස ඉල්ලා සිටිමු.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් සිට කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒක පාර්ශිකව කඩ කිරීම නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.4,976,220 ක යන මුදල්වල එකතුව වන රු.5,700,000 දැනට වසර 15 ක් තිස්සේ අයකර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | වොක්ෂෝල් වීදියේ අංක 234 දරණ ගොඩනැගිල්ල කුලියට ගැනීම වෙනුවෙන් ආයතනයට ආපසු අයකර ගතයුතු රු.5,700,000 ක මුදල නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් හෝ කපාහැරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබාදෙන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කමිටුවක් පත්කරන ලදී. එම කමිටුව අවස්ථා 04කදී රැස්වී මේ පිළිබඳව දීර්ඝව සාකච්ඡා කර අවසන් වාර්ථාව මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත මේ වන විට ඉදිරිපත් කර ඇත. ඒ අනුව මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඉදිරියේදී ලබාදෙන උපදෙස් අනුව කටයුතු කරණු ඇත. | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| (ආ) 1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමහ ඇතිකරගෙන තිබූ කුලී ගිවිසුම ප්‍රකාරව රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් අයකර දෙන ලෙස ඉල්ලා අවුරුදු 23 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබූ අතර එහිදී තීන්දුකර තිබුණේ අදාල මුදල අයකර ගැනීමට වුවත් තීන්දුව ලැබී දැනට වසර 05 කට ආසන්න කාලයක් ගතවී ඇතත් අදාල මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමඟ ඇතිකරගත තිබූ කුලී ගිවිසුමකට අනුව මණ්ඩලයට අයවිය යුතුව ඇති 2,520,000 මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු මේ වන විටත් සිදුකර ඇති අතර නඩුව ගොණු කරන ලද දිසා අධිකරණය නඩුවේ ප්‍රගතිය අප වෙත ඉදිරියේදී දැණුම් දෙන බව දන්වා ඇත. ඒ අනුව අධිකරණය මගින් ලබාදෙන තීරණය අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) 2013 වර්ෂයේ අවස්ථා 3 කදී රු.2,877,144 ක් සහ 2014 වර්ෂයේදී රු.749,583ක් ලෙස එකතුව රු.3,626,727 ක මුදලක් Archtype ආයතනය වෙත උපදේශන ගාස්තු ලෙස අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. වසර 7 – 8 ක කාලයක් බාහිර පාර්ශවයක් අත රඳවා තිබෙන මෙම මුදල ලබාගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | 2014 වර්ෂයේ දී Archtype ආයතනයට ගොඩනැඟිලි නවීකරණය කිරීම සඳහා අවශ්‍ය වන සැලසුම් සකස් කිරීම හා ගෘහ නිර්මාණ සකස් කිරීම වෙනුවෙන් රු.3,626,727 ක අත්තිකාරම් මුදලක් ගෙවා ඇත. නමුත් මෙම නවීකරණ කටයුතු පසුව සිදු නොකිරීමට තීරණය කර ඇත. මේ සම්බන්ධව අල්ලස් හා දූෂණ කොමිසම් සභාව මගින් විමර්ශනයක් සිදු කිරීම සඳහා අපගේ ලිපිගොනු වල මුල් පිටපත් ලබා ගෙන ඇති අතර එම විමර්ශනය අවසානයේදී අල්ලස් හා දූෂණ කොමිසම් සභාව මගින් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට අනුව ඉදිරියේදී ක්‍රියා කරනු ඇත. | අදාල ආයතනයෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඈ) බෙදාහැරීමේ ණයගැතියෝ ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.8,296,082 ක මුදලක් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී මෙම ශේෂයෙන් කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. මෙම ශේෂය තුල වසරක් පැරණි ණය ශේෂ රු.6,555,851 ක්ද, වසර 2 ක් පැරණි ණය ශේෂ රු.1,469,695 ක්ද, වසර 2 කට වඩා වැඩි පැරණි ණය ශේෂ රු.270,536 ක්ද ඇතුලත්ව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | ණය ශේෂයන් වන අතර එම ණය ශේෂයන් ද බැංකු ඇපකර මගින් ආවරණය වේ. මෙම හිඟ මුදල් අතරින් ගුණසේන රන්කොත්ගේ අලෙවි නියෝජිතවරයාගේ ශේෂය පමණක් අයකර ගැනීමට ඉතිරිව පවතින අතර අනෙකුත් ණය ශේෂ මණ්ඩලය මේ වන විටත් අයකර ගෙන ඇත. තවද මෙම හිඟ ශේෂය අයකර ගැනීම සඳහා මණ්ඩලය විසින් අලෙවි නියෝජිතවරයාගේ බැංකු ඇපකර අවලංගු කර අයකර ගැනීමට කටයුතු යොදා ඇති අතර ඒ වෙනුවෙන් අවශ්‍ය නීතිමය පියවරයන් ගෙන ඇත.<br>එසේම වසර 2කට වඩා පැරණි ණය ශේෂ වන රු.270,536 ක මුදල බෙදාහැරීමේ අලෙවි නියෝජිතවරුන් තිදෙනෙකුගේ ණය ශේෂයන් වන අතර, ඒ අතරින් රු.263,607.05 ක ණය ශේෂයක් හිමි ඒ.එච්.වීරකෝන් බෙදාහැරීමේ අලෙවි නියෝජිත වරයාගේ ණය ශේෂය අය | ලැබිය යුතු පැරණි ණය ශේෂ අයකර ගැනීමට |

| | | |
|---|---|---|
| | කර ගැනීමට නීතිමය පියවරයන් සිදුවෙමින් පවතී.<br><br>එමෙන්ම අලෙවි නියෝජිත පී.ඩී.ජේ.පෙරේරා මහතාගෙන් මණ්ඩලයට අයවිය යුතු රු.825 ක මුදල වහාම පියවන ලෙස ඔහුට ලිඛිතව දැනුම් දී ඇති අතර අලෙවි නියෝජිත ජේ.ඩබ්.චන්දන ජයලාල් මහතාගෙන් අයවිය යුතු රු.6,104.15 ක මුදල ගිණුම් වලින් කපා හැරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සිදුවෙමින් පවතී. ඉදිරියේදී එහි සඳහන් අය විය යුතු මුදල් නොලැබුණහොත් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කර බොල් ණය වශයෙන් කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | |

**1.6.2 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී, 2015 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන සඳහා නවාතැන් පහසුකම් සපයාගැනීම සඳහා එක් ආයතනයක් සහ පුද්ගලයින් තිදෙනෙකු වෙත රු.202,800 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබූ අතර වසර 7 ක් තිස්සේ ඒවා නිරවුල් කිරීමකින් තොරව ගිණුම්වල අත්තිකාරම් ගෙවීමක් ලෙස පෙන්වා තිබුණු බව නිරීක්ෂණය විය. | 2015 වර්ෂයේදී දැයට කිරුළ වැඩසටහන සඳහා නවාතැන් පහසුකම් ලබාගැනීම වෙනුවෙන් එක් ආයතනයකට සහ පුද්ගලයන් තිදෙනෙකු වෙත රු.202,800 ක මුදලක් අත්තිකාරම් ලෙස ගෙවා ඇත. මෙම ගෙවන ලද මුදල් අයකර ගැනීම සඳහා අවස්ථා කීපයකදී ඔවුන් වෙත ලිඛිත දැන්වීම් සිදුකලද මේ වනතෙක් ලබාදී නොමැත. එමෙන්ම මෙම මුදල නැවත අය කර ගැනීමට උත්සහ ගන්නා අතර එසේ අය කර ගැනීමට අපහසු වුවහොත් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කර අවශ්‍ය කටයුතු කරනු ඇත. | අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කිරීම. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17(5) වගන්තිය | ත්‍යාගලාභීන් හිමිකම් නෙ◌ාපෑ, මාස 06 ක කාලසීමාව ඉකුත් වූ ත්‍යාග විකිණීමෙන් ලැබෙන මුදල පළමු කොට අරමුදලටද ඉන් පසුව ජනාධිපති අරමුදලටද බැර කල යුතු වුවත් | යම් කිසි ප්‍රවර්ධන කටයුත්තක් වෙනුවෙන් අමතර ත්‍යාග සංචිත ගිණුම භාවිතා කරමින් මිලදී ගනු ලබන අතර එකී ත්‍යාග මාස 06 කල් පිරුණු පසුවද හිමිකම් පෑමක් හිමි නොවී ඇත්නම් එය | පනතේ වගන්තිය අනුව කටයුතු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | 2020 පෙබරවාරි 12 දිනට මාස 06 ක කාලසීමාව ඉක්මවූ පිරිවැය රු.1,428,172 ක් වූ ත්‍යාග අයිතම් 11 කට අදාල භාණ්ඩ 162 ක් විකිණීමෙන් ලැබෙන මුදල ජනාධිපති අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | තවදුරටත් ඉදිරි ප්‍රවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමට සුදුසු බවට නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. එබැවින් මෙම අයිතම විකිණීමකින් තොරව ඉදිරි ප්‍රවර්ධනයන් සඳහා යෙදවීමට කටයුතු යොදා ඇත. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | i. **VIII** පරිච්ඡේදයේ වගන්තිය 10.1 | සාමාන්‍ය රාජකාරී ඉටුකිරීමේදී වැඩිපුර ගමන් බිමන් යෑමට සිදුවන නිලධාරීන් සම්බන්ධව පරිවර්තිත ගමන් වියදම් දීමනාවක් අනුමත කිරීමට ආයතන ප්‍රධානියෙකුට හැකියාව තිබුණද එසේ නොකර කලාප කළමනාකරුවන් 9 දෙනෙකුට මාස 07 ක කාලයක් සඳහා ඉන්ධන හා අනෙකුත් දීමනා ලෙස රු.2,835,356 ක මුදලක් මණ්ඩලය ගෙවා තිබුණි. | කලාප කළමනාකරුවන් සිය ක්ෂේත්‍ර රාජකාරි සඳහා ගමන් කිරීමේදී ඔවුනට අයිති වාහන භාවිත කිරීම වෙනුවෙන් ඉන්ධන හා රථය සඳහා කි.මී 1කට රු.40ක දීමනාවක් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියෙන් ගෙවනු ලැබේ. එසේම ක්ෂේත්‍ර රාජකාරි සඳහා වාර්තා කිරීමේදී, රාත්‍රී නවාතැන් ගැනීමේදී, යැපුම් දීමනාවක් මුදල් අමාත්‍යංශය විසින් අනුමත කර ඇති අතර එම දීමනාවද ඉහත කි.මී 1කට රු.40 බැගින් වූ දීමනාවන්ගේ ද එකතුව විගණක විසින් සඳහන් කර ඇති මුළු වටිනාකම වේ. | ආයතන සංග්‍රහය අනුව අදාල ගෙවීම් සිදුකිරීමට කටයුතු කිරීම. |
| | ii. XIV පරිච්ඡේදයේ 8 වගන්තිය | රාජ්‍ය ආයතනවල ක්ෂේත්‍ර රාජකාරියේ යෙදී සිටින නිලධාරීන් ඔවුන් එම රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා ධාවනය කරනු ලබන වාහනය වෙනුවෙන් එක කිලෝමීටරයක් සඳහා රු.12 ක මුදලක් පමණක් ගෙවිය හැකි වුවද කිලෝමීටර් එකක් ධාවනය සඳහා මණ්ඩලය විසින් අලෙවි කළමනාකරුවන්ට රු.40 ක මුදලක් බැගින් ගෙවා තිබුණි. | මෙහිදි කලාප කළමනාකරුවන්ට සිය ක්ෂේත්‍ර රාජකාරි කටයුතු වලදී තම වාහනය භාවිත කිරීමට කි.මී 1ක් සඳහා රු.40 ක් ගෙවනු ලබන අතර වාහන නඩත්තුව හා අනෙකුත් සියළු වියදම් කලාප කළමණාකරුවන් විසින් දැරිය යුතු බැවින් ඒ ගැන සලකා බලා ඉහත රේටය අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියෙන් ගෙවා ඇත. තවද වාහනයක් කුලී පදනම මත ලබා ගත හොත් වර්තමාන වෙළඳපොලේ කුලී පදනම මත ලබා ගන්නා | ආයතන සංග්‍රහය අනුව කටයුතු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වාහනයකට කි.මී 1ක් සඳහා රු.40ක් ගෙවීමට සිදු වන බැවින් එම රේටය කලාප කළමනාකරුවන්ගේ සිය වාහනය භාවිත කිරීම වෙනුවෙන් ලබා දී ඇත. | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | i. මුදල් රෙගුලාසි 381 | රාජකාරී බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් (රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන්) ඉල්ලුම් කර අනුමැතිය ලබාගත යුතු වුවත් සංවර්ධන ලොතරැයි මණ්ඩලය නමින් රාජ්‍ය බැංකු 02 ක හා පෞද්ගලික බැංකු 02 ක පවත්වාගෙන ගොස් තිබූ ජංගම ගිණුම් 11 ක් සඳහා එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එම ජංගම ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් ආරම්භ කර තිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලයකින් ස්වාධීන වූ මුදල් අමාත්‍යාංශය මගින් පාලනය වන ආයතනයකි. එබැවින් යම්කිසි රාජකාරිමය කටයුත්තක් සඳහා මණ්ඩලයට යම් බැංකු ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා අවශ්‍ය කෙටුම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා එම ගිණුම රාජ්‍ය හෝ වාණිජ බැංකුවක ආරම්භ කර පවත්වා ගෙන යාම මේ වන තෙක් සිදු වී ඇති ක්‍රමවේදය වේ. මෙම විගණන විමසුමෙහි සඳහන් ගිණුම් 11 ද එම ක්‍රමවේදයට අනුව ආරම්භ කල ගිණුම් වේ.<br>එසේම ඉහත සඳහන් කල සං.ලො.ම. අධ්‍යක්ෂක මණ්ඩලයේ මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂකවරයෙක්ද සිටින බැවින් ඔහු ඇතුළු අනෙකුත් සෙසු සාමාජික අධ්‍යක්ෂකවරුන්ගේ පූර්ණ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මෙම ගිණුම් ආරම්භ කර ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම. |
| ii. | **මුදල් රෙගුලාසි 395 (ඇ)** | බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේ දී ඇති ගනුදෙනු තත්වය | වර්තමානයේ සියලුම බැංකු සැසඳුම් නියමිත කාලසීමාවේදී නිම කොට අදාල මාසය අවසන් වී දින 10ක් ඇතුලත පිලියෙල | මුදල් රෙගුලාසි අනුව බැංකු සැසඳුම් |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කල යුතු වුවත් මණ්ඩලය විසින් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ ප්‍රමාදයන් පවතින බව අවස්ථා 3 කදී නිරීක්ෂණය විය. | කිරීමට කටයුතු කරනු ලැබේ. | සකස් කර ඉදිරිපත් කිරීමට |
| iii. මුදල් රෙගුලාසි 756 (5) (අ) | 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතු භාවිතයට ගත නොහැකි රු.49,495 ක් වටිනා ත්‍යාග හා ප්‍රවර්ධන අයිතම් 08 කට අදාල භාණ්ඩ 80 ක් හඳුනාගෙන තිබුණද එම අයිතම් පොදු 47 ආකෘති පත්‍රයේ වාර්තා කර නොතිබුණි. | එකඟ වේ. මෙම හඳුනාගත් භාවිතයට ගත නොහැකි අයිතම සටහන් කිරීම වෙනුවෙන් වර්තමානයේ දී අවශ්‍ය පොත් සහ ලෙජර පොදු 47 ආකෘති පත්‍රය පරිදි වාර්තා කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට |
| (ඇ) 2018 නොවැම්බර් 14 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ (2) වගන්තිය | රාජ්‍ය බැංකුවලින් පරිබාහිරව 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.5,486,920 ක් වූ මණ්ඩලය සතු මුදල් පෞද්ගලික බැංකු ගිණුමක තැන්පත් කර එමඟින් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන කර තිබුණි. | දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්ගේ දෛනික තැන්පතුන් පහසු කිරීමේ අරමුණෙන් මෙම ගිණුම ආරම්භ කර ඇත. ඉදිරියේදී සිදු කරනු ලබන තැන්පතු ප්‍රමාණයන් නිරීක්ෂණය කර මෙම ගිණුම තව දුරටත් පවත්වාගෙන යන්නේද පිලිබඳව තීරණය කරනු ඇත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව කටයුතු කිරීමට |
| (ඉ) 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන හා 2018 නොවැම්බර් 14 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 03 වගන්තිය | 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.206,987,668 ක් ඉතිරිකිරීමේ බැංකු ගිණුමක හා රු.62,184,487 ක් සත්දින ඒක්ෂණ තැන්පතු ගිණුමක ආයෝජනය කිරීම සඳහා ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි. | දැනට පවත්නා ගෙන යනු ලබන ක්‍රමවේදය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීම වේ. ඒ වෙනුවෙන් අවශ්‍ය අනුමැතිය මේ වන විටත් ලබා ගෙන ඇති අතර විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී මුදල් අමාත්‍යාංශය වෙත ද යොමු කර එහි අනුමැතියද ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | විධිමත් පරිදි අනුමැතිය ලබාගෙන ආයෝජන කටයුතු සිදුකිරීම. |
| (ඊ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2008 දෙසැම්බර් 31 දිනැති අයවැය චක්‍රලේඛ අංක | මණ්ඩලය විසින් නිලධාරීන් 144 දෙනෙකු වෙත රු.250,000 ඉක්මවා රු.10,011,540 ක මුදලක් | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආරම්භයේ සිට මේ දක්වා මෙම ක්‍රමවේදය යටතේ සේවකයන් අභිප්‍රේරණය කිරීම සඳහා ආපදා | චක්‍රලේඛය අනුව කටයුතු කිරීමට |

| | | | |
|---|---|---|---|
| 142 හි 5.2 III වගන්තිය | ආපදා ණය වශයෙන් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | ණය ලබා දී ඇත. | |
| (උ)2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 ඡේදය | ආයතනය විසින් යම් සුභසාධන කටයුත්තක් ආරම්භ කරන්නේ නම් ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගත යුතු විය. නමුත් මණ්ඩලය විසින් කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඇතිවූ අයහපත් ආර්ථික තත්ත්වය මගහරවා ගැනීම සඳහා ආපදා ණය මුදලට සමගාමීව මූලික වැටුපට සමාන ණය මුදලක් ලබාදීමට කටයුතු කර තිබුණද ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොමැති බව නිරීක්ෂණය විය. | කොරෝනා වෛරසය ආරම්භවූ මුල් අවස්ථාවේ 2020 මාර්තු මස 18 සිට මැයි මස 12 දක්වා රට වසා තැබීම හේතුවෙන් මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුද එම කාලය තුල ක්‍රියාත්මක නොවීය. එම නිසා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ආදායම් අහිමි වීම නිසා ඔවුන්ගේ දෛනික ජීවිත අඩාල වී ඇති බවත් ඒ සඳහා ණය අත්තිකාරමක් ලබාදෙන ලෙස කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉල්ලීමක් සිදුකලද එය ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදී. නමුත් අඛන්ඩව ඉල්ලීම් සිදුකිරීම හා ඔවුන්ගේ දැඩි විරෝධතාවය හමුවේ ඉල්ලීම් කල අත්තිකාරම් මුදලට වඩා අඩු එනම් මූලික වැටුපට සමාන මුදලක් ලබාදීමට සිදුවිය. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී. වර්තමානය වන විට එම ලබාදුන් අත්තිකාරමට අදාල සියලු මුදල් මේ වන විට අයකරගෙන ඇත. මෙම අත්තිකාරම් මුදල ලබාදීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් ලබාගෙන නොමැත. කෙසේ නමුත් මින් ඉදිරියේදී මෙවැනි ආකාරයේ අත්තිකාරම් මුදල් ලබාදීමක් සිදු නොකිරීමට තීරණය කර ඇත. | ණය ලබාදීමේදී චක්‍රලේඛ අනුව අනුමැතිය ලබාගැනීම. |
| (ඌ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත යාවත්කාලීන අයවැය ලේඛනයේ පිටපතක් ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට නොඅඩු කාලයකදී | එකඟ වේ. 2019 වර්ෂයේ අග භාගයේ සිදු වූ දේශපාලනික වෙනස්වීම් සහ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් නොවීම යන කාරණා මත 2020 | PED/12 දරන චක්‍රලේඛය අනුව කටයුතු කිරීම |

| | | | |
|---|---|---|---|
| | විගණකාධිපතිවරයා වෙත යැවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලය විසින් එය ඉදිරිපත් කර තිබුණේ 2020 ජූලි 16 දිනය. | අයවැය අනුමත කිරීමේ දී ප්‍රමාදයක් සිදුවිය. කෙසේ නමුත් 2021 වර්ෂයේ අයවැය ලේඛණය 2020 වර්ෂයේ දෙසැම්බර් මස 12 වන දින විගණකාධිපතිවරයා වෙත භාර දී ඇත. | |
| (එ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිගේ 2017 ඔක්තෝබර් 03 දිනැති අංක MF/06/20/Common/2017 දරන ලිපිය | ප්‍රසම්පාදන සැලැස්මට පරිභාහිරව කිසියම් මිලදීගැනීමක් කරන්නේ නම් ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බවත් ඒ බව මැනවින් සාධාරණීකරණය කළ යුතු බවත් දන්වා තිබුණද මණ්ඩලයේ 2020 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට පරිභාහිරව රු.මිලියන 15.4 ප්‍රසම්පාදනයන් පූර්ව අනුමැතියක් ලබැගැනීමකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත්ව නොතිබූ එකී මිලදී ගැනීම් හා සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය සඳහා 2020 දෙසැම්බර් මස අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇති අතර එය 2021.01.27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමැතිය ලබා දී ඇත. | පූර්ව අනුමැතිය ලබාගෙන ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,018,654,911 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.2,668,792,667 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.349,862,244 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පිරිහීමට ආදායම් බදු, ත්‍යාග ගෙවීම් සහ වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

**සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරුණි.**

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ටිකට්පත් විකුණුම් ආදායම රු.2,032,384,652 කින් හෙවත් සියයට 12 කින් අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ වෙනත් ආදායම් රු.35,496,364 කින් හෙවත් සියයට 18 කින් පහළ වැටී තිබුණි.

(ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේදී ත්‍යාග වියදම රු.1,200,979,164 කින් හෙවත් සියයට 13 කින් අඩුවී තිබුණි. 2020 වර්ෂයේදී ටිකට්පත් දිනුම් ඇදීමේ වියදම රු. 74,091,096 කින් හෙවත් සියයට 13 කින් අඩු වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී බෙදාහැරීමේ පිරිවැය රු.861,770,154 කින් හෙවත් සියයට 20 කින් අඩුවී තිබුණි. එම අඩුවීමට අලෙවිකරණ ආශ්‍රිත පිරිවැය රු.37,786,734 කින් හෙවත් සියයට 86 කින් අඩුවීම, ප්‍රචාරණ පිරිවැය රු.202,715,432 කින් හෙවත් සියයට 62 කින් අඩුවීම සහ බෙදාහැරීමේ පිරිවැය රු.266,152,929 කින් හෙවත් සියයට 63 කින් අඩුවීමද හේතුවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

-------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම්වශීලතාවය දැක්වෙන ලාභදායීත්වය හා ද්‍ර , .හයක් පහත දැක්වේඅනුපාත පිළිබඳ විග්‍ර

| | 2020 | 2019 |
|---|---|---|
| | -------- | ------- |
| <u>මෙහෙයුම් අනුපාත</u> | සියයට | සියයට |
| විකුණුම් ආදායමට විකුණුම් හා බෙදාහැරිමේ වියදම් | 22 | 25 |
| විකුණුම් ආදායමට විකුණුම් පිරිවැය | 58 | 58 |
| <u>ලාභදායීත්ව අනුපාත</u> | | |
| දළ ලාභ අනුපාතය | 42 | 42 |
| ශුද්ධ ලාභ අනුපාතය | 20 | 16 |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් අනුපාතය මුළු මෙහෙයුම් වියදමේ ප්‍රතිශතයක් ලෙස | 87 | 89 |
| ශුද්ධ ලාභයෙන් ත්‍යාග පවරා තිබීමේ අනුපාතය | 11 | 13 |
| ශුද්ධ ලාභයට ආදායම් බදු අනුපාතය | 0.4 | 9 |
| <u>ද්‍රවශීලතා අනුපාතය</u> | | |
| ජංගම අනුපාතය | 1:1.66 | 1:1.63 |
| ක්ෂණික අනුපාතය | 1:1.64 | 1:1.6 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් කරනු ලබන විකුණුම් හා බෙදාහැරීමේ වියදම්, විකුණුම් මිලෙන් සියයට 25 සිට සියයට 22 දක්වා අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී උපයා ඇති ශුද්ධ ලාභයෙන් සියයට 11 ක්ම නියෝජනය කර ඇත්තේ පාරිභෝගික ජනතාවට ලබාදිය යුතු ත්‍යාග ආපසු පවරා ගැනීම මඟිනි. මෙම ප්‍රතිශතය ඉකුත් වර්ෂයේදී සියයට 13 ක අගයක් පෙන්නුම් කර තිබුණු අතර ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ ලාභයට ආදායම් බදු අනුපාතය පිළිවෙලින් සියයට 9 ක සහ සියයට 0.4 ක පහළ අගයක් ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලොතරැයි අලෙවි ආදායම රු.2,032,384,652 ක් එනම් සියයට 12 කින් අඩු වී තිබීමට සාපේක්ෂව විකුණුම් පිරිවැය රු.1,283,859,397 කින් එනම් සියයට 13 කින් පහළ යාම දළ ලාභ අනුපාතය සියයට 42 ක ඒකාකාරී මට්ටමක පැවතීම කෙරෙහි බලපා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාත පිළිවෙලින් 1.63 හා 1.66 ක අගයක් විය. ඒ අනුව මණ්ඩලයේ ජංගම වත්කම් අනුපාතය ප්‍රශස්ථ මට්ටමෙන් පවතින බවක් නිරීක්ෂණය නොවන හෙයින් සමාලෝචිත වර්ෂයේදී ද කාරක ප්‍රාග්ධන කළමනාකරණය කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුවී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන කමිටුව විසින් 2008 අප්‍රේල් 18 දින රු.8,095,000 වටිනා ඩබල් කැබ් රථයක් පෞද්ගලික ආයතනයකින් ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදී තිබූ අතර එම වාහනය ආයතනය වෙත ලැබී නොතිබුණි. පසුව එම ආයතනයෙන් වාහනය සඳහා ගෙවීම් කරන ලෙස කල ඉල්ලීම මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් 2009 වර්ෂයේදී මණ්ඩලයට විරුද්ධව නඩු පවරා තිබුණි. එම නඩුවෙහි තීන්දුව පෞද්ගලික ආයතනයට පක්ෂව ලබාදී තිබුණි. ඒ වෙනුවෙන් මණ්ඩලය විසින් රු.16,842,554 මුදලක් දරා තිබුණි. | රු.16,842,554ක කැබ් මුළු රථයේ පිරිවැය රථය රැගෙන ගිය පාර්ශවයෙන් අයකර ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු වර්තමානය වන විට කරගෙන යනු ලබයි. | වාහනය නොලැබෙන්නේ නම් අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) විධිමත් සැලසුමකින් තොරව ප්‍රවර්ධන අයිතම් මිලදිගැනීම හේතුවෙන් රු.3,623,367 ක් වටිනා ප්‍රවර්ධන අයිතම් කුඩ (පිරිමි), ටී ෂර්ට්, සෝලා ලාම්පු, කැප් ,පොසිලේන් සෙට්, ජල පෙරන ගබඩාවේ තබාගෙන තිබුණි. මණ්ඩලයේ ප්‍රවර්ධන තොග නැවත ඇණවුම් මට්ටම පිළිබඳ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබන බව නිරීක්ෂණය නොවුණි. | මෙම තොග වලින් බහුතරය පවත්නා කොවිඩ් වසංගත තත්වයට පෙර ඇණවුම් කර ලබාගත් ඒවා වන අතර ඒවා භාවිතා කිරීමට සැලසුම් කර තිබූ ප්‍රවර්ධන වැඩසටහන්, අලෙවි නියෝජිත රැස්වීම් ආදිය අවලංගු වීම නිසා ගබඩාවේ ඉතිරි වී ඇත. | ප්‍රසම්පාදන අයිතම් මිලදීගත් වර්ෂයේම සැලසුම් කල පරිදි බෙදාහැරීමට කටයුතු කල යුතු වීම. |
| (ඇ) 2019 ඔක්තෝබර් 24 දින ටිකට්පත් හි ත්‍යාග රටාවන් පිළිබඳ සාකච්ඡා කිරීම වෙනුවෙන් පැවති රැස්වීමේදී ගබඩාවේ පවතින ජයග්‍රහණ සඳහා හිමිකම් පා නොමැති මාස 06 ක කාලය ඉක්මවූ ත්‍යාග ඉදිරි තරඟ සඳහා යොදාගැනීමට මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ මිලදීගත් රු.529,850 ක් වටිනා යතුරු පැදි 02 ක් 2019 | මෙම යතුරු පැදි දෙක ඉදිරි ක්ෂණික ලොතරැයිපත් සඳහා ඇතුලත්කර ඇති නමුත් පසුගිය කාල වකවානුව තුල සිට මේ දක්වා රටේ පවතින Covid වසංගත තත්වය හේතුවෙන් ක්ෂණික ලොතරැයිපත් අලෙවිය ඉතාමත් පහළ මට්ටමක පැවතුනී. එම ටිකට්පත් ඉදිරියේදි වෙළඳපොලට නිකුත් කිරීමට නියමිතයි. | ඉදිරි ක්ෂණික ලොතරැයි පත් සඳහා ත්‍යාග ලෙස ඇතුලත් කිරීමට කටයුතු කල යුතු වීම. |

| | | |
|---|---|---|
| දෙසැම්බර් මස වෙළඳපොලට හඳුන්වා දෙන ක්ෂණික ලොතරැයිපතේ ත්‍යාගයක් ලෙස හා 2020 පෙබරවාරි ලග්න වාසනාව විශේෂ දිනුම් ඇදීමේ ත්‍යාග ලෙස ලබාදීමට අවශ්‍ය කටයුතු කරන මෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) වෙත උපදෙස් ලබාදී තිබුණද එම යතුරු පැදි 02 ම විගණිත දිනය වූ 2021 පෙබරවාරි 12 වන දින වන විටත් ගබඩාවේ පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | | |
| (ඇ) රු.592,500 වටිනා ත්‍යාග වවුචර්පත් 123 ක් වසර 12 ක කාලයක් තුල මණ්ඩලය විසින් ප්‍රයෝජනයට නොගෙන රඳවා තබාගෙන ඇති බව නිරීක්ෂණය විය. මින් රු.7500 වටිනාකමින් යුත් වවුචර් පත් 07 ක් 2019 අගෝස්තු 31 දිනට කල් ඉකුත්වී තිබුණි. තවද රු.585,000 වටිනාකමින් යුත් රු.5000 වවුචර්පත් 117 ක් පැවති අතර, එම වවුචර් පත්වල කල් ඉකුත්වීමේ දිනය සඳහන් නොවුණි. ඒවා 2009 වර්ෂයේදී මිලදී ගත් වවුචර්පත් වන අතර දැනට මිලදීගෙන වර්ෂ 12 ගතවී ඇති බැවින් ඉදිරි ත්‍යාග ලබාදීමේ කටයුතුවලදී මෙම වවුචර්පත් භාවිතයට ගැනීමේ හැකියාවේ අවිනිශ්චිතභාවය පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | මෙහි සඳහන් වටිනාකම ඇති වවුචර් පත් යාවත්කාලීන කර ගැනීම වෙනුවෙන් වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ ප්‍රධානත්වය යටතේ සතොස ආයතනය සමඟ සාකච්ඡා පැවැත්වූ අතර එහිදී සතොස ආයතනය සතුව අදාල තොරතුරු නොමැති වූ හෙයින් ඊට අදාල සියළු තොරතුරු සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ලබාදෙන ලදී. ඒ අනුව වෙළඳ අමාත්‍යාංශයේ විසින් සතොස ආයතනය වෙත ලිඛිතව දන්වා ඇත්තේ එකී මුදල සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙත නැවත ගෙවීමට කටයුතු කරන ලෙසයි. ඉදිරියේදී එය මණ්ඩලය වෙත ලැබීමට නියමිතය. | මණ්ඩලය වෙත එම මුදල් ලබාගැනීම. |
| (ඉ) කෙරීගෙන යන වැඩ ගිණුමෙහි ඇතුලත් කෑම කාමරය (Lunch Room) හා ගබඩා කාමරය (Stores Room) සඳහා පිළිවෙලින් රු.1,336,676 ක් හා රු.246,918 ක් වශයෙන් එකතුව රු.1,583,594 ක් මුදලක් 2018 වර්ෂය වන විට වැය කර තිබුණි. මේ සඳහා 2019 හා 2020 වර්ෂ සඳහා කිසිඳු වියදමක් දරා නොමැති අතර වැඩ නිමව ඇත්නම් අදාල වත්කම්වල පිරිවැය ගිණුම්ගත කර ක්ෂය කිරීමට කටයුතු කර නොමැති බවද නිරීක්ෂණය විය. | කෑම කාමරය හා ගබඩා කාමරය සකස් කිරීම සඳහා වන සැලසුම් සකස් කිරීමට රු.1,583,594 ක මුදලක් වැය කර ඇති අතර නමුත් එම කාර්යයන් මේ වන තෙක් නිමකර නොමැත. එම නිසා කෙරීගෙන යන වැඩ ගිණුමෙහි එම මුදල ඇතුලත් කර ඇත. ඉදිරියේදී එම කාර්යයන් නිම කිරීමෙන් පසුව වත්කමක් ලෙස හඳුනාගෙන ක්ෂය කිරීමට කටයුතු කරණු ඇත. | කාර්ය නිම කර වත්කමක් ලෙස හඳුනාගැනීමට කටයුතු කිරීම. |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ත්‍යාග අයිතම් අතුරින් මිලදීගෙන වර්ෂ 02 ඉක්මවූ රු.548,224 ක් වටිනා ජංගම දුරකථන 08 ක හා ටැබ් පරිගණක 04 ක වගකීම් කාලය ඉක්මවා තිබූ අතර රු.32,510 ක් වටිනා මවුන්ටන් බයිසිකල් 02 ක් හා ලී රූපවාහිනී රඳවනයක් භාවිතයට ගත නොහැකි මට්ටමේ පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මින් දුරකථන 03 ක්, ටැබ් පරිගණක 04 ක් හා මවුන්ටන් බයිසිකල් 02 ක් 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මඟින් විකිණීම සඳහා හඳුනාගෙන තිබුණද විගණිත දිනය වූ 2021 පෙබරවාරි 12 වන විටත් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය. | මෙම අයිතම විධිමත් අපහරණ ක්‍රියාවලියක් යටතේ අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | අනුමැතිය සහිතව අපහරණ කටයුතු සිදුකිරීම. |
| (ආ) මණ්ඩලයේ මුළු ටිකට්පත් ඉතිරිවීමේ ප්‍රතිශතය 2016, 2017, 2018, 2019 හා 2020 වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා පිළිවෙලින් 0.2, 24.01, 10.41, 7.57 හා 14.1 ක් විය. මෙම ප්‍රතිශත අනුව පැහැදිලි වන්නේ ටිකට්පත් නොවිකිණී ඉතිරිවීමේ ප්‍රතිශතය පසුගිය කාලපරිච්ඡේදය තුල ඉතා විශාල ලෙස වැඩිවී ඇති බවයි. 2020 වර්ෂයේ මුල් මාස 7 තුල ඉතිරි වූ ටිකට්පත්වල මුද්‍රණ වියදම රු. ලක්ෂ 181 ක් වී තිබුණි. | 2017,2018,2019 වර්ෂවලට සාපේක්ෂව 2020 වර්ෂයේ මුල් කාර්තුවේ ඉතා අඩු ආපසු එවීම් ප්‍රතිශතයක් වාර්තා වූ අතර එම ප්‍රතිශතය ජනවාරි සියයට 7, පෙබරවාරි සියයට 4 ක් ලෙස වාර්ථා විය. නමුත් ඉන් අනතුරුව කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ඉතා ඉහළ ප්‍රතිශතයක් ආපසු එවීම් වාර්තා වීම නිසා එම වසරේ ඉහළ ආපසු එවීම් ප්‍රතිශතයක් පෙන්නුම් කෙරුනි. | ටිකට්පත් ආපසු එවීම් අවම මට්ටමකට පවත්වා ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) 2016 වර්ෂයට පෙර සිට ගබඩාවේ පැවති භාවිතා නොකල නමුත් ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමේ පැවති රු.505,407 ක් වටිනා ප්‍රවර්ධන අයිතම් 10 කට අදාළ භාණ්ඩ 119 ක් වෙන්දේසි කිරීමට පාලන අංශයට භාරදී තිබූ අතර ඉන් රු.325,569 ක් වටිනා අයිතම් 07 කට අදාල භාණ්ඩ 76 ක් වෙන්දේසි කොට 2020 වර්ෂයේදී රු.38,954 ක් උපයා තිබුණි. ඒ අනුව භාවිතයට ගනු නොලැබූ ප්‍රවර්ධන අයිතම් හේතුවෙන් රු.286,615 ක් එනම් සියයට 88 ක පාඩුවක් මණ්ඩලයට ඇතිවී තිබූ බව නිරීක්ෂණය විය. | සාමාන්‍යයෙන් අපහරණ ක්‍රියාවලියකට යොමු කරනු ලබන්නේ භාවිතයෙන් ඉවත් කල හා යල් පැන ගිය අයිතමයන් වේ. එබැවින් එම අයිතම මිලදී ගත පිරිවැයට අලෙවි කිරීමට හැකියාවක් ප්‍රයෝගිකව නොමැත. එබැවින් එම භාණ්ඩ අපහරණය කිරීම තුලින් ලාභයක් ඉපයිය නොහැකි බව දන්වමු. | ප්‍රවර්ධන අයිතම මිලදී ගනු ලැබූ වර්ෂය තුලදීම ඒවා ලබාදීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී ගබඩාවේ ඉතිරිවූ ටිකට්පත් 5,938,989 හා නොවිකිණී ඉතිරි වූ ටිකට්පත් 83,323,876 වෙනුවෙන් රු.41,122,828 මුද්‍රණ වියදමක් දරා තිබුණි. | 2020 මාර්තු මස සිට රටේ පැවැති අනපේක්ෂිත කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් වරින් වර රට වසා තැබීම හා අලෙවියට බාධා වීම හේතුවෙන් විශාල තොග ප්‍රමාණයක තොග ඉතිරි වී ඇතත් අනුව මේ වසරේදී එම . තත්වයට වඩා සාර්ථකව මුහුණ දීම සඳහා වඩා සැලසුම් සහගතව ඇණවුම් කටයුතු සිදු කිරීමට කටයුතු කර ඇත. | සැලසුම් සහගතව ඇණවුම් කටයුතු සිදු කිරීම. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.6 ඡේදය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/98, 8/98 (I) සහ 8/98 (II) යන්හි සඳහන් පරිදි කාර්ය මණ්ඩලයේ කාර්යඵල ඇගයීම් වාර්ෂිකව සිදුකළ යුතු වුවද මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ කාර්ය ඵල ඇගයීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට තීරණය කර ඇති අතර එ් අනුව KPI (මූලික කාර්ය දර්ශක) මේ වන විට සකස් කරගෙන යනු ලබයි. ඒ අනුව 2022 වර්ෂයේ සිට මෙය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛ අනුව කටයුතු කිරීම. |
| (ආ) 2018 දෙසැම්බර් මස සිට අක්‍රීයව පවතින අංක 2695680 දරන ලංකා බැංකු සත්දින ඒක්ෂණ බැංකු ගිණුම වසා දැමීමට හෝ වෙනයම් පියවරක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැනට අක්‍රිය තත්වයේ පවතින අංක 2695680 දරණ සත් දින එ්ක්ෂණ ගිණුම ඉදිරියේදී වසා දැමීමට පියවර ගනු ලැබේ. | වසා දැමීමට හෝ වෙනයම් පියවරක් ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) සංවර්ධන ලොතරැයි මණ්ඩලය සතු වාහන හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මණ්ඩලය නමින් ලියාපදිංචි වී ඇති වාහන එකිනෙක සැසඳීමේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මණ්ඩලය නමින් ලියාපදිංචි වී ඇති වාහන 37 ක් මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | සංවර්ධන ලොතරැයි මණ්ඩලය සතු වාහන ඒ ඒ කාල වලදී විධිමත් අපහරණ ක්‍රියාවලියක් තුලින් ටෙන්ඩර් කැදවා අලෙවි කර ඇති අතර එහි අයිතියද විධිමත්ව ගැනුම්කරුවන්ට පවරා දී ඇත. නමුත් මිලදී ගන්නා ලද පාර්ශවයන් විසින් එම මෝටර් රථ ඔවුන්ගේ නමට නැවත ලියාපදිංචි කර ගැනීම සඳහා මෝටර් රථ දෙපාර්තමේන්තුවට යොමු කර නොමැති බව නිරීක්ෂණය වේ. මෙය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ පාලනයෙන් බැහැර ක්‍රියාවකි. කෙසේ වෙතත් ඉදිරියේදී මෝටර් රථ අපහරණය සිදු කිරීමේදී ගැනුම්කරු විසින් ගැනුම්කරුගේ නමට ලියාපදිංචි කිරීමෙන් අනතුරුව මණ්ඩලයෙන් එම | මණ්ඩලය නමින් පවතින භෞතිකව නොමැති වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දැනුවත් කර එම පද්ධතියෙන් ඉවත් කිරීම. |

| | | |
|---|---|---|
| | මෝටර් රථ බැහැරට රැගෙන යාමට අවසර ලබා දෙනු ඇත. | |
| (ඇ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආරම්භයේ සිටම පරිපාලන හා මෙහෙයුම් කටයුතු සම්බන්ධව කාර්ය පරිපාටි සංග්‍රහයක් සකස් කර නොතිබුණු අතර එම කාර්යය සඳහා 2016 වර්ෂයේදී සුදුසුකම්ලත් අයෙකු පත්කර තිබුණි. අදාළ පාර්ශවය විසින් පවත්නා නීති රීති අධ්‍යයනය කර අදාල කාර්යය පරිපාටි සංග්‍රහය පිළියෙල කර 2019 ඔක්තෝබර් 14 දින සංවර්ධන ලොතරැයි මණ්ඩලයට භාරදී තිබුණි. මෙම කාර්යය වෙනුවෙන් රු.4,500,000 ක් අදාල පාර්ශවයට ගෙවීමට එකඟ වී තිබූ අතර ඉන් රු.1,700,000 ක් මේ වන විට ගෙවා තිබුණි. ඔහු විසින් අදාල කාර්යය පරිපාටි සංග්‍රහය කොටස් දෙකකින් යුතුව මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණද මණ්ඩලයේ දැනට පවතින ක්‍රමවේදයට අනුකූල නොවන ලෙස මෙම කාර්යය පරිපාටි සංග්‍රහය සකස් කර ඇති බවට හේතු දක්වා ඉතිරි මුදල ගෙවීම අත්හිටුවා තිබුණි. තවද මෙම කාර්යය සඳහා අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන්ව තිබූ "ලොතරැයි හා දිනුම් ඇදීමේ කටයුතු, අභ්‍යන්තර පාලනය සහ විගණන කටයුතු" සඳහා වූ රීතින් සකස් කිරීම යන කාර්යයන් අත්හිටුවන ලෙස මණ්ඩලය විසින් එය සකස් කළ පාර්ශවය වෙත දන්වා තිබුණි. ඒ අනුව අදාල කාර්යය මේ වන තෙක් නිමවී නොතිබුණු අතර ඒ සඳහා වැයකර තිබූ මුදල සකසුරුවම් නොවූ ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය. තවද මෙම කාර්ය සඳහා අත්සන් කරන ලද ගිවිසුම් කොන්දේසි කඩ කිරීම සහ ගෙවිය යුතු ඉතිරි මුදල පිළිබඳව නෛතික අවදානමක් පවතින බවද විගණනයේදී නිරීක්ෂණය විය. | සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා කාර්ය පටිපාටියක් සකස් කිරීමට සුදුසුකම් ලත් අයෙකු පත්කර ගෙන ඇත. ඒ අනුව ඔහු ගිවිසුමට අනුව ඇතැම් කොටස් කෙටුම්පත් කර මණ්ඩලය වෙත ලබාදී ඇත. ඔහු විසින් ලබාදෙන ලද එම කොටස් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වූයේ ඔහු සකස් කර ඇති කොටස් වැඩි ප්‍රතිශතයක් ආයතන සංග්‍රහය හා මූල්‍ය රෙගුලාසි ඇතුලත් බවයි. එබැවින් ව්‍යාපාරික ආයතනයට ගැලපෙන ලෙස නැවත කෙටුම්පත් කර අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව අදාල සම්පත්දායක මහතා සමඟ අවස්ථා කීහිපයකදී මණ්ඩලය සමඟ සාකච්ඡා කර ඇති අතර වර්තමානයේ නැවත සකස් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. නැවත සකස් කල කොටස් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ලැබෙන උපදෙස් මත ඉදිරියේදී ක්‍රියා කරනු ඇත. | මණ්ඩලය බලාපොරොත්තු අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතු වීම. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජංගම අලෙවි රථවලින් අලෙවි කල ටිකට්පත් විකුණුම් ආදායමින් සියයට 40 ක් පිරිවැය ලෙස දරා ඇති අතර ඒ අනුව රු.20 ටිකට්පතක විකුණුම් පිරිවැය රු.8 ක් විය. මෙසේ ජංගම අලෙවි රථවලින් අලෙවි කරන ටිකට්පත් තොග මණ්ඩලයේ සාමාන්‍ය ටිකට්පත් විකුණුම් ක්‍රියාවලිය හරහා අලෙවි නියෝජිතයින් මඟින් අලෙවි කිරීම සිදුකලේ නම්, රු.27,629,085 ක අතිරේක ආදායමක් උපයාගත හැකිව තිබුණි. ඒ අනුව ජංගම රථවලින් සිදුකරන ටිකට්පත් අලෙවිය වෙනුවෙන් දරනු ලබන පිරිවැයට සරිලන ප්‍රතිලාභයක් ලබාගැනීමට මණ්ඩලය අපොහොසත් වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | මෙහිදි වෙළඳපොලේ ඇති තරඟකාරීත්වය හා දිනුම් අදින ලොතරැයිපත් බහුලව පැවැත්ම හේතුවෙන් පාරිභෝගිකයින් ක්ෂණික ලොතරැයිපත්වලින් ඉවත්ව දිනුම් අදින ලොතරැයි වෙත යොමු වී ඇත. ඒ අනුව ක්ෂණික ලොතරැයි අලෙවියට විශාල ප්‍රයත්නයක් දැරිය යුතු අතර මේ සඳහා කිසිඳු ප්‍රචාරණ වියදමක් දරන්නේද නැත.<br>එබැවින් ක්ෂණික ලොතරැයි අලෙවියේ ප්‍රවර්ධන උපාය මාර්ගයක් ලෙස හා වැඩි අලෙවියක් ලබාගැනීම සඳහා ජංගම රථ යොදාගනු ලැබේ. මෙයින් ලැබෙන ලාභාන්තිකය අඩු වුවද ක්ෂණික ලොතරැයිපත් අලෙවි කිරීමේ උපාය මාර්ගයක් ලෙස ජංගම රථ යොදා ගෙන ඇත. | ක්ෂණික ලොතරැයි අලෙවිය වැඩි කිරීමට ක්‍රියාමාර්ග ගැනීම. |
| (ආ) දෛනිකව දිනුම් අදිනු ලබන ලොතරැයිපත්වල දිනුම් අදිනු ලබන අවස්ථාව වන විට බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් වෙත මණ්ඩලය විසින් ලබාදී නොතිබුණ ටිකට්පත් පැවතීම මෙන්ම උප ගබඩාව මඟින් අදාල ඉන්වොයිස් අනුව නිවැරදි බාර්කෝඩ් සහිත ලොතරැයිපත් නිකුත් නොකිරීම යනාදී යම් දෝෂයක් මත ගැටළු ඇතිවන අවස්ථාවලදී එකී ටිකට්පත් අදාල නියෝජිතයාගේ විකුණුම් ලෙස සලකා පරිගණක පද්ධතියට ඇතුල් කර දිනුම් ඇදීමේ කටයුතු සිදු කර තිබුණු අවස්ථා විය. මේ සඳහා සහකාර සාමාන්‍යාධිකාරිගේ (මුදල්) අනුමැතිය ලබාදී තිබුණි. දිනුම් ඇදීමෙන් පසුව අදාල නියෝජිතයාගෙන් ලිඛිත ඉල්ලීමක් ලබාගැනීමෙන් පසු එකී ටිකට්පත්වල බාර්කෝඩ්වලට අදාල තැගි අත්හිටුවීම, එය පසුව ඉවත් කිරීම හා නියෝජිතයින් වෙත ආපසු මුදල් ගෙවීම ආදී කටයුතුද විධිමත් අනුමැතියකින් තොරව සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) විසින්ම සිදුකර | ලොතරැයි තොග බෙදාහැරීමේ නියෝජිතයන් හට ප්‍රවාහනය කරනු ලබන්නේ දුම්රිය සහ බස් රථ යොදා ගනිමිනි. ඇතැම් අවස්ථා වලදී එම ලොතරැයි තොග දුම්රියේදී හෝ බස් රථ වලදී අස්ථාන ගත වන අවස්ථා ඇත. එවැනි අවස්ථා වලදී එම ටිකට් තොග අදාල බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් අලෙවි කල සේ සලකා ඔවුන්ගේ නමින් ගනුදෙනු සටහන් කරනු ලැබේ. පසුව එම තොග බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් වෙත ලැබුණු බව ඔවුන් මගින් ලිඛිතව සනාථ කර ගැනීමෙන් පසුව එම මුදල් නැවත බෙදා හැරීමේ අලෙවි නියෝජිතයන්ගේ ගිණුම් වලට බැර කරනු ලැබේ.<br>නමුත් ඉහත ක්‍රියාවලිය පිළිබඳ විගණන අංශය විසින් පෙන්වා දුන් පසු බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් වෙත ප්‍රවාහනය කරනු ලබන දිනට පසු දින එම ටිකට් තොග අස්ථාන ගත වූ බව බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් විසින් තහවුරු කර ගැනීමෙන් පසු එම ටිකට් තොගය විකුණුම් ලෙස ගිණුම් | විධිමත් පරිදි ටිකට්පත් බෙදාහැරීමේ ක්‍රමවේදයක් ඇති කිරීම හා අලෙවි නියෝජිතයින් වෙත ටිකට්පත් ලැබුණු බවට තහවුරු ලබාගැනීම. |

| | | |
|---|---|---|
| තිබුණි. 2020 වර්ෂය තුලදී එවැනි අවස්ථා 13 ක් නිරීක්ෂණය වූ අතර එහි විකුණුම් වටිනාකම රු.307,861 ක් විය. | ගත නොකරයි. ඒ අනුව මෙවැනි ආකාරයේ ගැටළුවක් ඉදිරියේදී ඇති නොවනු ඇත. | |
| (ඇ) වර්ෂය තුල අතිරේකව ඇණවුම් කල ටිකට්පත් ප්‍රමාණය 31,779,000 ක් වූ අතර ගබඩාවේ නිකුත් නොවී ඉතිරි වූ ටිකට්පත් ප්‍රමාණය 1,255,570 ක් විය. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 4 ක් වූ අතර අද කෝටිපති ටිකට් පතේ මෙම ප්‍රතිශතය සියයට 6 ක් ලෙස ඉහළ අගයක් ගෙන තිබුණි. ටිකට්පත් අතිරේක ඇණවුම් කිරීම නිසි කළමනාකරණයකින් සිදුනොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | විගණක විසින් පෙන්වා දී ඇති 1,255,570ක් ඉතිරි වීමට හේතු වුයේ, 2020 වර්ෂයේ පැවති COVID තත්වය හේතුවෙන් යම් යම් ප්‍රදේශ හුදෙකලා කිරීම හේතු කොට ගෙන එම ප්‍රදේශ වල අලෙවි නියෝජිතයින් ලොතරැයි රැගෙන නොයාම නිසා ගබඩාව තුල තොග ඉතිරි විය. | අතිරේක ටිකට් ඇණවුම් කිරීමේදී අලෙවිය පිළිබඳ තහවුරු ලබාගැනීම. |
| (ඈ) අංක DLB/FIN/MStores/4-4 දරන 2020 ජනවාරි 29 දිනැති ලිපිය මඟින් ප්‍රධාන ගබඩාවේ කළමනාකරණ සහකාර විසින් 2019 වර්ෂයේ දෙසැම්බර් මාසයේ හා 2020 වර්ෂයේ ජනවාරි මාසයේ දිනුම්වාර කිහිපයකට අදාලව ඇණවුමකින් තොරව ටිකට්පත් 281,000 ක් ගබඩාවට ලැබී තිබූ බව ඉහළ කළමනාකරණයට වාර්තා කර තිබුණි. ඒ අනුව ටිකට්පත් ඇණවුම් කිරීම, ඇණවුම් කල ටිකට්පත් ගබඩාවට භාරගැනීම සහ අතිරේක ඇණවුම් මඟින් ටිකට්පත් ලබාගැනීම යනාදී පියවරයන් නිසි ක්‍රමවේදයකට සිදුනොවන බව විගණනයට නිරීක්ෂණය විය. තවද එම හේතුව නිසා 2020 වර්ෂයේ මුල් මාස 7 තුලදී අතිරේකව ඇණවුම් කල ටිකට්පත් ප්‍රමාණයෙන් සියයට 4 ක් හෙවත් ටිකට්පත් 1,255,570 ක් ඉතිරි වී තිබුණි. | ටිකට්පත් මුද්‍රණකරු විසින් මණ්ඩලය මඟින් ලබාදෙන ඇණවුමට වැඩි අතිරේක ටිකට් ප්‍රමාණයක් සපයා තිබුණි. නමුත් ඒ සඳහා භාණ්ඩ ලැබුම් පත්‍ර (GRN) නිකුත් නොකර ඇති අතර ඒ සඳහා ගෙවීම් ද සිදු කර නොමැත. | ඇණවුම් නොකර ටිකට්පත් එවීම සම්බන්ධව මුද්‍රණකරුවන් දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඉ) 2020 වර්ෂයේ මාර්තු සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය සැලකීමේදී කොරෝනා රෝගය පැතිර යෑම හේතුවෙන් මණ්ඩලයේ අලෙවි ආදායම 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී රු.3,124,722,840 කින් හෙවත් සියයට 45 කින් පහත වැටී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | එකඟ වේ. මෙය දිවයිනේ සෑම ව්‍යාපාරික අංශයකටම පොදු වූ කාරණයකි. | අලෙවි ආදායම වැඩි දියුණු කිරීමට උපායමාර්ග ක්‍රියාත්මක කිරීම. |
| (ඊ) 2020 ජනවාරි 30 දින ප්‍රසම්පාදන කමිටු නිර්දේශ අනුව සුපර්බෝල් විශේෂ දිනුම් ඇදීමේ ස්කුටි සැපයීම සඳහා තෝරාගනු | සාමාන්‍ය මිලදී ගැනීමකදී මෙන් එකවර ලංසු පැවරීම මෙහිදී සිදුව නොමැති අතර ජයග්‍රාහකයින් ඉදිරිපත්වන ආකාරය අනුව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව |

| | | |
|---|---|---|
| ලැබූ ජයග්‍රාහී ලංසුකරුට එදිනම භාණ්ඩ ඇණවුම් නියෝග නිකුත් කර තිබුණි. එහෙත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (ආ) වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා ලංසුවේ වලංගු කාලය ඇතුලත කොන්ත්‍රාත් ප්‍රදානය පිළිබඳ අවසාන තීරණය ගනුලැබූ විගස ප්‍රතිග්‍රහණ ලිපියක් අදාල සැපයුම්කරු වෙත නිකුත් කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණ ඉදිරිපත් කිරීමට හා 8.9.1 ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමටද කටයුතු කර නොතිබුණි. | වරින්වර භාණ්ඩ ඇණවුමක් ඉදිරිපත් කිරීම මගින් මෙම යතුරුපැදි මිලදී ගෙන ඇත. කවර යතුරුපැදි මිලදී ගෙන ගබඩාකර තබා ගැනීම මත සිදුවිය හැකි අපහසුතා අවම වන අයුරින් මෙහිදී කටයුතු කර ඇත. | කටයුතු කිරීම. |

## 3.5 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලය සතු එකතුව රු.270,749,417 ක මුදලක් ඵලදායී කාර්යයක යොදා නොගෙන ජංගම ගිණුම් 06 ක රඳවා තබාගෙන තිබුණි. | මෙම මුදල් ත්‍යාග ගෙවීම් වෙනුවෙන් එකතුවන්නා වූ මුදල් වන අතර මෙම මුදල් අපගේ ජංගම ගිණුම් වල රඳවා නොගෙන සත් දින ඒක්ෂණ ගිණුම් වල රඳවනු ලැබේ. එසේ සත් දින ඒක්ෂණ ගිණුමෙහි මුදල් රඳවා තැබීමෙන් මණ්ඩලයට අමතර ආදායමක් ජනිත වේ. එසේම මෙම මුදල් මණ්ඩලයේ අවශ්‍යතාවය පරිදි හා කුමන අවස්ථාවකදී කොපමණ ජයග්‍රාහකයන් සංඛ්‍යාවක් ඉදිරිපත් වේද යන්න අප නොදන්නා බැවින් එම මුදල් කෙටි කාලීන ආයෝජන වශයෙන් වත් නොරඳවා ඉහත කී ආකාරයෙන් සත් දින ඒක්ෂණ ගිණුමක රඳවනු ලැබේ. | ජංගම ගිණුම්වල පවතින මුදල් ඵලදායී කාර්යයන්වල යෙදවීම. |

## 3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් භාවිතා කරන ලද පිරිවැය රු.1,352,610.58 ක් වූ යතුරුපැදි 07 ක් වසර 02 මාස 11 අධික කාලයක් කාර්යාල පරිශ්‍රයේ රථගාල තුල ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවා තබා තිබුණි. | අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් විසින් භාවිතා කරන ලද යතුරු පැදි 07ක් ප්‍රධාන කාර්යාලයේ රථ ගාලේ නවතා තබා ඇත. මෙම යතුරු පැදි අලුත්වැඩියා කිරීමට විශාල පිරිවැයක් වැය වන බැවින් එය අපහරණය කිරීමට කටයුතු සුදානම් කර | භාවිතයට ගත නොහැකි නම් අපහරණය කිරීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| | ඇත. ඒ අනුව විධිමත් අපහරණ ක්‍රියාවලියක් තුලින් අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | |

**3.7 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේදී රු.5,565,000 කට මිලදීගන්නා ලද Rear body රහිත Double Wheel කෑ කැබ් රථය අලෙවි ප්‍රචාරණ රථයක් ලෙස සකස් කිරීමට 2018 ඔක්තෝබර් 18 දින පෞද්ගලික ආයතනයකට භාරදී ඇති අතර 2020 දෙසැම්බර් 30 දින වන විට වසර 2කට වැඩි කාලයක් ගතවී ඇති නමුත් මණ්ඩලය බලාපොරොත්තු වූ අරමුණ ඉටුවී නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 වගන්තියේ විධිවිධාන සැලකිල්ලට නොගෙන පිරිවිතරයන් සකස් කර මිල ගණන් කැඳවා තිබූ අතර මිලදීගත් ආයතනයේ අනුමැතියකින් තොරව නවීකරණය කර තිබුණි. තවද මෙම කාර්ය සඳහා මිලදීගන්නා ලද භාණ්ඩවල වසරක් සඳහා වූ වගකීම් කාලය අවසාන වී තිබීම, වත්කම හා එහි උපාංගවල ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් නොවීම හා කාර්ය සාධන ඇපකරවල වලංගු කාලයද ඉක්මවා ගොස් තිබීම යනාදී කරුණු මත රු.11,991,900 වැයක් දැරීමට යෝජිත මෙම මෙහෙයුම් කටයුත්ත ප්‍රශ්නගත බව විගණනයේදී නිරීක්ෂණය විය. | මේ වන විට මෙම ප්‍රචාරක රථයේ සියළුම කටයුතු )Modifications) අවසන් කර එම රථය අදාල ආයතනය විසින් මණ්ඩලයට භාර දී ඇතඑම රථයට අව .ශ්‍යා LED තිර මිලදී ගැනීම සහ සවිකිරීම රූපවාහිනී සංස්ථාවේ තාක්ෂණික උපදෙස් මත සිදුකර ඇත. | මණ්ඩලයේ අරමුණ ඉටුකරගැනීමට මෙම රථය යෙදවීම. |
| (ආ) මණ්ඩලයේ ප්‍රධානතම මෙහෙයුම් කාර්යයක් වන ලොතරැයිපත් මුද්‍රණ කටයුතු 2017 වර්ෂයේ සිටම විධිමත් ප්‍රසම්පාදන සැලැස්මකට අනුව සිදුකර නොතිබූ අතර පවත්නා ගිවිසුම් කාලය අවසන්වීමට ලංවූ පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. සාමාන්‍යයෙන් මාස 06 ක් පමණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරනු ලබන අතර එම නිසා පවත්නා ගිවිසුම් කාලයද මාස 06 ත් 08 ත් අතර කාලයක් දීර්ඝ කර තිබුණි. 2017 අගෝස්තු 01 දින සිට මේ දක්වාම මුද්‍රණ ආයතන දෙකක් පමණක් ඒ සඳහා තෝරා ගෙන තිබුණි. | 2020/21 වර්ෂයට අදාල ටිකට්පත් මුද්‍රණය කිරීමේ ප්‍රසම්පාදන කටයුතු 2020 මාර්තු 15 දින ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ අතර එම කටයුතු 2020 ජුනි 01 දින සිට ආරම්භ කර තිබුණි.<br>රටේ පැවති කෝවිඩ් වසංගත තත්ත්වය මත 2020 මාර්තු 16 දින සිට 2020 මැයි 11 දක්වා රට වසා තිබූ අතර කාර්යාල කටයුතු 2020 මැයි 11 දින නැවත ආරම්භ කරන ලදී. මෙම ප්‍රසම්පාදන කටයුතු 2020 ජුනි 01 දින ආරම්භ කර ඇති අතර, එම කටයුතු ආරම්භ කර හැකි කිට්ටුම දිනයේදී ආරම්භ කර ඇති බව දන්වා සිටිමු. | ලොතරැයි ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව ඉටුකිරීම. |

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 ඡේදය අනුව ප්‍රසම්පාදනයේ සමස්ථ වටිනාකම රු.මිලියන 250 ඉක්මවන විට, එය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හෝ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ප්‍රසම්පාදන කමිටුව මඟින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකල යුතුය. නමුත් මණ්ඩලය විසින් ඒ පිළිබඳව කිසිදු අවධානයක් යොමුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය. 2020/2021 වසර සඳහා ඇස්තමේන්තු ගත මුද්‍රණ වියදම රු.මිලියන 422 ක් වුවද, එය ලොතරැයිපත් වර්ග 7 ක් සඳහා වූ ප්‍රසම්පාදන 7 ක් ලෙස දක්වමින් එය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමත මූල්‍ය සීමාව යටතේ සිදුකල හැකි බව වාර්තා කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් මෙම කාර්යය සිදුකල යුතු බැව් සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) විසින් 2020 මැයි 29 දින නිර්දේශ කර ඒ සඳහා සභාපති හා සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය ලබාගෙන තිබුණි. ඒ අනුව මෙම කාර්යයන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව සිදුකරන ලද ක්‍රියාවක් බව නිරීක්ෂණය විය.

මණ්ඩලය විසින් දිනුම් ඇදීම ටිකට්පත් වර්ග 07 ක් මුද්‍රණය සඳහා එක් ලොතරැයි ටිකට්පත් වර්ගයක් මුද්‍රණය කර සැපයීමට සැපයුම්කරුවකු තෝරා ගැනීම එක් ප්‍රසම්පදනයක් සේ සැලකිල්ලට ගෙන මේ සඳහා ලංසු කැඳවා ඇති අතර මෙහිදී එක් එක් ලොතරැයි වර්ගයට අදාල ලංසු වෙන වෙනම ඇගයීමට ලක් කෙරේ. සියළුම ලොතරැයි වර්ග සැපයීමට අදාලව එක් ප්‍රසම්පදනයක් සේ ලංසු කැඳවීම තුල සියලුම ලොතරැයිපත් සැපයීම සඳහා එක් සැපයුම්කරුවකු තේරී පත් වුවහොත් ඒ තුල මණ්ඩලයට විශාල මුද්‍රණ අවධානමකට මුහුණ දීමට සිදු වනු ඇත. මන්ද යත් සැපයුම්කරු ගේ යාන්ත්‍රික දෝෂ හෝ වෙනත් සැපයුම්කරුගේ පාර්ශවයෙන් බැහැර තත්වයන් තුල ටිකට්පත් සැපයීම සඳහා බලපෑ හැකි සිදු වීම් හේතු කොට ගෙන සිදු විය හැකි අවධානම් තත්වය මෙහිදී ප්‍රමුඛව සලකා බලා ඇත. එබැවින් සැපයුම්කරුවන් කිහිප දෙනෙකු තෝරා ගැනීම තුල මණ්ඩලයේ මුද්‍රණ අවධානම අවම වන බැවින් එක් ටිකට්පත් වර්ගයක් සැපයීමට එක් සැපයුම්කරුවකු වන සේ ටිකට්පත් වර්ග 7 සඳහා වෙන වෙනම ලංසු කැඳවීම සිදු කර ඇත. මීට වසර ගණනාවක පටන් අවසන් වර්ෂය දක්වාම අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් මෙපරිදීම ලංසු කැඳවා එම මුද්‍රණ කටයුතු සිදු කරමින් පැවතුණි.

ඒ අයුරින්ම මෙම වර්ෂයේද එම ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන කම්ටුවල අධිකාරී සීමාව තුල එලෙසම එම ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලදී. විශේෂයෙන් මීට පෙර වර්ෂ වලද අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව එලෙසම කටයුතු කර තිබූ අතර එම පූර්වාදර්ශය ප්‍රකාරව ඒවරද එලෙසටම එම කටයුතු සිදු කරන ලදී.

එසේම අවසන් වශයෙන් පැවති ටිකට්පත් අවශ්‍යතාවයට අනුව ඇස්තමේන්තුගත පිරිවැය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු සීමාව ඉක්මවන බැවින් එම ප්‍රසම්පාදන කටයුතු අමාත්‍ය මණ්ඩලය පත් කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව මගින් සිදු

- එම -

| | | |
|---|---|---|
| | කිරීම මේ වන විට ආරම්භ කර ඇති බවද දන්වා සිටිමි. | |
| (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 ඡේදය අනුව ප්‍රසම්පාදනයේ සමස්ථ වටිනාකම රු.මිලියන 250 ඉක්මවන විට, එය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හෝ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ප්‍රසම්පාදන කමිටුව මඟින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකල යුතුය. නමුත් මණ්ඩලය විසින් ඒ පිළිබඳව කිසිදු අවධානයක් යොමුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය. 2020/2021 වසර සඳහා ඇස්තමේන්තු ගත මුද්‍රණ වියදම රු.මිලියන 422 ක් වුවද, එය ලොතරැයිපත් වර්ග 7 ක් සඳහා වූ ප්‍රසම්පාදන 7 ක් ලෙස දක්වමින් එය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමත මූල්‍ය සීමාව යටතේ සිදුකල හැකි බව වාර්තා කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් මෙම කාර්යය සිදුකල යුතු බැව් සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) විසින් 2020 මැයි 29 දින නිර්දේශ කර ඒ සඳහා සභාපති හා සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය ලබාගෙන තිබුණි. ඒ අනුව මෙම කාර්යයන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව සිදුකරන ලද ක්‍රියාවක් බව නිරීක්ෂණය විය. | එකී අමාත්‍ය මණ්ඩල තීරණය 2017 වර්ෂයේ සිට අදාල කරගෙන ඇත. ඊට හේතුවී ඇත්තේ 2016 හා 2017 යන වර්ෂ වල ක්‍රියාත්මක වූ ප්‍රසම්පාදන වලදී ඇතැම් විදේශ සමාගම් බද්ධ ව්‍යාපාර ලෙස ලංසු ඉදිරිපත් කර ටිකට් මුද්‍රණය සඳහා සම්බන්ධ වී පසුව හවුල් ව්‍යාපාරය නාමිකව පවත්වා ගෙන යමින් විදේශ සමාගම පමණක් සියළු මුද්‍රණ කටයුතු මෙහෙයවීම හා BOI පහසුකම් මත අමුද්‍රව්‍ය ආනයනය කිරීම මඟින් අනිසි ලෙස පිරිවැය වාසි ලබා ගැනීමට උත්සහ කර ඇති බව නිරීක්ෂණය වී ඇත. එම තත්වය තුල බද්ධ ව්‍යාපාරය නාමිකව ක්‍රියාත්මක වන හෙයින් විදේශ සැපයුම්කරු විසින් සම්පූර්ණ ක්‍රියාවලිය සිදුකිරීම තුල මෙරටින් පිටතට සිදුවන මුදල් හුවමාරුවීම් සැලකිල්ලට ගෙන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් ඒ සඳහා සුදුසු කොන්දේසි ඇතුලත් කිරීමට තීරණය කෙරිනි.<br>ඒ අනුව, මේ පිළිබඳව නෛතික උපදෙස් ලබාගෙන ලංසුකරු සියයට 100 දේශීය හිමිකාරීත්වයක් පැවතිය යුතු යන කොන්දේසිය ලංසු ලියවිලි ගත කරන ලදී. එතැන් පටන් එම ලංසු කොන්දේසි නොවෙනස්ව පැවතුනි | - එම - |
| (ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 වගන්තිය අනුව, ලංසුකරුවකුවීමට ඍජුවම බලපාන යම් සාධකයක් පවතී නම් හා එය ලංසු ආරාධනයෙහිද වක්‍රව බලපාන යම් කරුණක් වේ නම් එය ලංසු ලේඛනවලද ඇතුලත් කල යුතු නමුත් එසේ කිරිමකින් තොරව වර්ෂයේ ලංසු ඇගයීම 2020 තික්ෂේප කර තිබුණිප්‍ර. | ලංසු කොන්දේසි ප්‍රකාරව ඇගයීම් කටයුතු සිදුවන අතර ලංසු කොන්දේසි වලට අනුකුල නොවන ලංසු පත්‍රිකා ප්‍රතික්ෂේප වීම සිදුවේ. එසේම පෙර වර්ෂ වලදී මණ්ඩලයේ සැපයුම්කරුවන්ගේ කාර්ය සාධනය ඇගයීමේදී සලකා බලන බව ලංසු ලියවිලි වල ඇතුලත් කොට ඇත. එබැවින් එවැනි සමාගම් වල කාර්ය සාධනය සහ විශ්වාසය කඩවීම් තත්වයන් ද ඇගයීමේදී සලකා බලන ලදී. ඊට හේතු වන්නේ විශ්වාසය කඩ කල සැපයුම්කරුවකුට ලංසු පිරිනැමීම තුල සිදු වූ විශ්වාසය කඩවීමේ තත්වයන් තව දුරටත් සිදු නොවීම පිළිබඳව මණ්ඩලයේ පාර්ශවයට ඇති අවධානම නිසාවෙනි. | - එම - |

| | | |
|---|---|---|
| | එබැවින් ලංසු ඉදිරිපත් කර ඇති ලංසුකරුවන්ගේ යෝජනා පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ඒ අනුව සිදුව ඇති බව මින් දන්වා සිටිමු. | |
| (ඊ) මණ්ඩලය විසින් රු.3,275,246 ක වියදමක් දරා Sweep App හරහා ලොතරැයිපත් නිකුත් කිරීම සඳහා කටයුතු කර තිබුණද Oracle ආයතනය විසින් මුද්‍රණය කරන ලද ලොතරැයිපත් එම පහසුකම ඔස්සේ ලබාදීමට එකඟ වී නොතිබුණි. තවද අමතර මුද්‍රණ යන්ත්‍ර කිසිවක් නොමැතිවීම මෙන්ම මුද්‍රණ දෝෂ සහිතව දිගින් දිගටම ලොතරැයිපත් මුද්‍රණය කර තිබීම යන අඩුපාඩු තිබියදීත් එම ආයතනය සුදුසුකම් සපුරා ඇති ආයතනයක් ලෙස පිළිගැනීම විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය. | Sweep app සඳහා ලොතරැයිපත් නිකුත් කිරීමේදී ඒ සඳහා ලබාගනු ලබන ලොතරැයිපත් ප්‍රමාණය නිශ්චිතව නොදැක්වීම හා එම ඊ ටිකට්පත් සඳහා අමතර රක්ෂණාවරණයක් ලබාගත යුතු හෙයින් එම රක්ෂණ පිරිවැය ඉහල අගයක් ගැනීම මත Oracle International ආයතනය විසින් එම ඊ ටිකට්පත් සැපයීම සිදු නොවුණි.<br>කෙසේ වෙතත් Oracle සමාගම මේ වන විටත් මණ්ඩලයේ ටිකට් පත් සැපයුම් කරුවකු වන බැවින් හා Oracle සමාගම සාර්ථක සැපයුම්කරුවකු ලෙස සඳහන් කිරීමට නොහැකි තරමටම සැපයීම් දුර්වලතා නොමැති බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් Oracle සමාගම සාර්ථක ලංසු කරුවකු බවට හඳුනාගෙන ඇත. | මුද්‍රණකරුගේ අඩුපාඩු පවතින නිසා තරඟකාරී මිල කැඳවීම් කර හොඳම මුද්‍රණකරුවන් තෝරාගැනීම. |
| (උ) ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු තීරණ හේතුවෙන් 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ලොතරැයිපත් මුද්‍රණයේදී මණ්ඩලයට දැරීමට සිදුවූ මුළු අතිරික්ත වියදම රු.72,479,000 ක් විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව යම් ප්‍රසම්පාදනයකට අදාල නිර්දේශයන් ඉදිරිපත් කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කරනු ලබයි. එබැවින් එම කමිටු නිර්දේශ ප්‍රකාරව ලංසු පැවරීම සිදුවන හෙයින් විගණනය විසින් දක්වා ඇති පරිදි අතිරික්ත වියදමක් දැරීමට සිදුව නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව නිවැරදිව තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබාගැනීම. |
| (ඌ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8 (ආ) ඡේදය ප්‍රකාරව විෂය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති අවම වශයෙන් එක් සාමාජිකයෙකුගෙන්වත් තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත විය යුතු වුවත් සුපර්බෝල්, ශනිදා වාසනා හා ලග්න වාසනා විශේෂ දිනුම් ඇදීම වෙනුවෙන් කාර් හා ස්කූටි මිලදීගැනීම සඳහා පත්කර තිබූ සුළු ප්‍රසම්පාදන තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහා වාහන විෂය පිළිබඳ විශේෂ දැනුමකින් යුත් සාමාජිකයෙකු ඇතුලත්ව නොතිබුණි. | ලොතරැයි ජයග්‍රහණ වලට අදාල ත්‍යාග සඳහා මෝටර් රථ හා යතුරුපැදි අදාල ඒජන්ත ආයතන වෙතින් brand new පමණක් මිලදී ගනු ලබයි. ත්‍යාග සඳහා භාණ්ඩ මිලදී ගැනීම සාමාන්‍ය මිලදී ගැනීමකට වඩා වෙනස් වන අතර යම් ත්‍යාගයකට අදාලව මණ්ඩලය විසින් එම ත්‍යාගය සඳහා වෙන් කරනු ලබන ත්‍යාග මුදලට උපරිම ප්‍රතිලාභය ජයග්‍රාහකයාට හිමි වන අයුරින් ත්‍යාග සඳහා වෙන්කළ මුදල සැලකිල්ලට ගෙන එම රථ වාහන මිලදී ගැනීම සිදු කරයි. එහිදී තාක්ෂණික | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| | කරුණු හා සම්බන්ධයෙන් අවශ්‍ය සහාය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 7.3.1 අනුව ආයතනයේ ප්‍රවාහන නිලධාරී වෙතින් ලබා ගෙන ඇත. එහෙයින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ විෂය විශේෂඥයකු නොමැති වුවද විශේෂඥ උපදේශක සේවාවන් ලබාගෙන ඇගයීම් ක්‍රියාවලිය සිදුකර ඇත. | |
| (එ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (අ) වගන්තිය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ ආකෘතිය අනුව සාමාජිකයින් දෙදෙනෙකු විසින් ලංසු විවෘත කර තිබුණද මෙම කමිටුව සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලද බවට ප්‍රමාණවත් තොරතුරු විගණිත ලිපිගොනුවේ දක්නට නොලැබුණි. | ලංසු විවෘත කිරීමේ කමිටුව ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත පත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට ක්‍රියාත්මක කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කිරීම. |
| (ඒ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව පිරිනමනු ලැබීමට පෙර ප්‍රසම්පාදන කමිටු විසින් දී ඇති නිර්දේශ සඳහා ගණන්දිමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් උක්ත ප්‍රසම්පාදන නිර්දේශය 3 සඳහාම සභාපතිවරයාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | මණ්ඩලයේ ප්‍රසම්පාදන කටයුතු වලදී එම කමිටු තීරණ එලෙසම ක්‍රියාත්මක කිරීම සාමාන්‍ය ක්‍රමවේදය ලෙස අනුගමනය කරමින් පැවතුණි. එහෙත් මේ වන විට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත හා සුළු ප්‍රසම්පාදන කමිටු තීරණ සභාපතිතුමාගේ අනුමැතිය මත ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කිරීම. |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 342 ක් වූ අතර, තත්‍ය කාර්ය මණ්ඩලය 316 ක් විය. මේ අනුව පුරප්පාඩු 39 ක් පවතින බව නිරීක්ෂණය විය. | 2020 දෙසැම්බර් 31 වන දිනට මණ්ඩලයේ සම්පූර්ණ පුරප්පාඩු 39ක් පැවතුණි. මින් ඇතැම් තනතුරු දිගුකාලීන අවශ්‍යතාවයක් නොමැති බව තීරණය කර යටපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව එ් පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ලිපියක් මගින් දන්වා යවා ඇත. නමුත් මේ සඳහා අනුමැතියක් ලැබී නොමැත. එමෙන්ම ඇතැම් තනතුරු සඳහා (සහකාර සාමාන්‍යාධිකාරී විකුණුම්, තත්ත්ව පාලන සහකාර හා ක්ෂේත්‍ර ප්‍රවර්ධක) බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා හෝ සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති අතර ඒ සඳහා බඳවා ගැනීම්ද ඉදිරියේදී සිදුකරණු | සේවා අවශ්‍යතාවය මත පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. |

ඇත. ඒ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව ඉදිරියේදී අඩුවනු ඇත.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | එකඟ වේ. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික වාර්තාව නියමිත දිනට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වීම. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිනැති අංක 02 ජුනි 2003PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ඡේදයේ සඳහන් 5.1.3 ක්ෂ මණ්ඩල අනුමැතිය සහිත පරිදි අධ්‍ය යාවත්කාලීන සංයුක්ත සැලැස්මේ පිටපතක් කට 15 ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට දින පෙර විගණකාධිපතිවරයා වෙත යැවිය යුතු වුවත් මණ්ඩලය විසින් එය විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2020 වර්ෂයේ පෙබරවාරි මස 19 වන දිනය. | එකග වේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 4.3 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ගනු ලැබූ තීරණ 5 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තාවේ සඳහන් වේ. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ගනු ලැබූ තීරණ 5 ක් ක්‍රියාත්මක කිරීම. |